2024.03.20

**මාධ්‍ය නිවේදනය.**

වගකිව යුතු පක්ෂයක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයේ ගැඹුර හා සංකීර්ණ බව සමගි ජන බලවේගය මැනවින් තේරුම් ගෙන ඇති බව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයින් අද (20) පස්වරුවේ පාර්ලිමේන්තුවේ දී හමු වූ අවස්ථාවේ දී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ප්‍රකාශ කළේය.

මෙම සාකච්ඡාවේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයන්ට විපක්ෂ නියෝජිතයන් කරුණු ගණනාවක් පිළිබඳ ව අවධානය යොමු කරවමින් ප්‍රකාශ කළේ අප ගන්නා සෑම පියවරක් ම රට බංකොළොත් භාවයෙන් මුදවා ගැනීමටත්, ආයෝජන සවිමත් කිරීමටත් ජනතාවගේ ආර්ථික ශක්තිය සවිමත් කිරීමටත් හේතු විය යුතු බවයි.

විශේෂයෙන් රටෙන් හරි අඩකට ආසන්න සංඛ්‍යාවක් දුප්පතුන් වී ඇති බවත් මේ තත්ත්වය නිසා කුටුම්භවල ආදායම් මට්ටම ශීඝ්‍ර ලෙස පහළ වැටී ඇති බවත් ඒ නිසා ළදරුවන්,ගැබිනි කාන්තාවන්, මව්වරුන්, දරුවන්, 41 ලක්ෂයක් පාසල් සිසුන් මෙන්ම තරුණයන් තුළ ද මන්දපෝෂණ තත්ත්වය වර්ධනය වී ඇති බවත් එය මැඩපැවැත්වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය අවශ්‍ය බවත් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පෙන්වා දුන්නේය. මේ සඳහා පවතින දුප්පත්කම තුරන් කිරීමේ සමාජ ආරක්ෂණ වැඩසටහන් ප්‍රමාණවත් නොවන බැවින් ජනසවිය වැඩසටහනේ ආකෘතිය ගත් නව සමාජ ආරක්ෂණ වැඩසටහනක් අවශ්‍ය බවත් එහි දී පාරිභෝජනය, ආයෝජනය, ඉතිරි කිරීම ආදී ක්ෂෙත්‍ර ද ආවරණය විය යුතු බවත් විපක්ෂ නායකවරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

එහි දී, විපක්ෂ නියෝජිතයන් පෙන්වා දුන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහභාගීත්වය ඇතිව රටේ ආර්ථික අර්බුදයට මුහුණ දිය යුතු බවට තමන් කළ යෝජනාවට, ආණ්ඩුව මෙයට පෙර ප්‍රතිචාර දැක්වූවා නම්, වර්තමානයේ උද්ගතව ඇති තත්ත්වය නිර්මාණය නොවන බවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය විසඳීමට ඉදිරිපත් කළ මාර්ග සිතියමට සහ ඉලක්කවලට සමගි ජන බලවේගය ධනාත්මක ව එකඟ වන නමුත්, සමහර යෝජනා ක්‍රියාත්මක කිරීම සංශෝධනය විය යුතු බවද මෙහි දී අවධාරණය කරන ලදී.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සිදු විය යුත්තේ රට බංකොලොත්භාවයෙන් මුදවා ගෙන තිරසර ලෙස ණය ගෙවීමේ හැකියාව ලබා ගැනීමට බවද අරමුදලේ නියෝජිත පිරිසට අවධාරණය කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බදු ආදායම ලබා ගැනීමේ දී ඉදිරිපත් කර ඇති යෝජනාව වූ දළ දේශිය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වූ අගයට එකඟ විය හැකි මුත්, එම ආදායම ලබා ගැනීමේ ක්‍රමවේදය වෙනස් විය යුතු බව සාකච්ඡාවේ දී පෙන්වා දුනි. එය ජනතාවට පීඩාවක් නොවන, සමාජ සාධාරණත්වය ඇති කළ හැකි ආකාරයෙන් සිදු කළ යුතු බව අවධාරණය කෙරුණි.

බදු එකතු කිරීම, සුරා බදු එකතු කිරීම මෙන් ම රේගු බදු අය කිරීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා සියළු ම ක්ෂේත්‍ර ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සිදු කිරීමට පියවර ගැනීමටත්, ඒ සඳහා වූ අවකාශය පුළුල් කරන අන්දමත් සාකච්ඡාවට බඳුන් විය.

දේශපාලන ආවරණ ලබා ගන්නා ව්‍යාපාරිකයන් මෙන් ම කළු කඩ ව්‍යාපාර තුලින් අහිමි වන ආදායම ලබා ගැනීම සඳහා වූ ක්‍රමවේදයක් ඇති කිරීම පිළිබඳ ව ද කරුණු ඉදිරිපත් කරන ලදි.

රාජ්‍ය වියදම් කළමනාකරණයේ දී ආයතනවල කාර්ය සාධනය පදනම් කර ගත් වැඩපිළිවෙලක් ක්‍රියාවට නංවන බව ද අවධාරණය කෙරුණි.

සංකෝචනය වූ ආර්ථිකය ඉදිරි වසර දහය තුළ වසරකට 10% ක අඛණ්ඩ වර්ධන වේගයක් ලබා ගැනීම සඳහා සැලසුම් කරන බැව් අවධාරණය කළ අතර, ඒ සඳහා උපාය මාර්ග සැකසීමේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ගිවිසුමේ යම් යම් සංශෝධන සිදු කළ යුතු බව ද පෙන්වා දුනි.

සමගි ජන බලවේගයේ අපේක්ෂාව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි ස්ථානගත කිරීම යි. එය ගෝලීය ආර්ථික වෙළෙඳපොලට පිවිසෙන තරඟකාරී ව්‍යුහයක් විය යුතු බව යි. එයට අවශ්‍ය කරන ආයෝජන හා ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති, රටේ ආර්ථිකය ශක්තිමත් වන ආකාරයට සංශෝධනය කිරීමේ වැදගත්කම ද නියෝජිත පිරිසට පැහැදිලි කරන ලදී.

ජාත්‍යන්තර ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ප්‍රමුඛත්වය දිය යුතුය. එය ප්‍රමාද වීම තුළ ආයෝජනවලට ඇතිවන බලපෑම විශාල ය. ඒ සඳහා ණය ප්‍රතිව්‍යුහගතකරණය සිදුකොට රට බංකොලොත්භාවයෙන් මුදවා ගෙන ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් තුළට පිවිසීමේ වැදගත්කම සමගි ජන බලවේගය අවබෝධ කරගෙන ඇති බව ද අවධාරණය කරන ලදී.

ජනරජයක් ලෙස ණය ගෙවීමට බැඳී සිටින බවත්, ණය ආපසු ප්‍රතිව්‍යුහගත කිරීමේ දී රටට උපරිම වාසියක් මෙන් ම වට්ටමක් ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවත්, නියෝජිතයින්ට පැහැදිලි කර දෙන ලදී.

ඒ අතරතුර යම් ණයක් අවභාවිත කර ඇත්නම් ඒ ගැන විමර්ශනය කිරීමටත්, එයට වගකිවයුතු පාර්ශ්වයනට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කිසිදු පැකිලීමකින් තොරව ක්‍රියා කරන බව ද සඳහන් කළේය.

ඇතැම් රාජ්‍ය ව්‍යවසාය, දූෂණය, නාස්තිය සහ දුර්වල කළමනාකරණය තුළ ආර්ථිකයට විශාල බලපෑමක් එල්ල කරන බවත්, එවැනි ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ දී රටට උචිත ගැලපෙන ක්‍රමෝපායක් තුළ කටයුතු කරන බවත් පෙන්වා දෙන ලදී.

එසේම පසුගිය කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ මව්වරුන්ගේ, ළදරුවන්ගේ සහ ළමුන්ගේ මන්දපෝෂණය ඉහළ මට්ටමකට පැමිණ ඇති බව අවධාරණය කළ විපක්ෂ නායකතුමා, ඒ සඳහා සාධනීය මැදිහත් වීමක් සිදුවිය යුතු බව ද අවධාරණය කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ දී රටේ ජාතික ආදායමට 50% ක දායකත්වයක් ද, 52% ක රැකියා නියුක්තියක් ද සහිත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ගැටළු පිළිබඳ ව ද මෙහි දී අවධානය යොමු කරන ලදි. එමෙන් ම මේ වන විට දැඩි අර්බුදයකට ලක්ව ඇති ගොවි, ධීවර, ස්වයං රැකියා, රාජ්‍ය සේවයෙහි මෙන් ම රටේ මධ්‍යම පන්තියේ ගැටළු පිළිබඳව ද දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කළේය.

රටේ සමස්ත ජනතාවම, දැඩි ආර්ථික අපහසුතාවයනට මුහුණ දී ඇති බැවින්, විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ජනතාව සඳහා වූ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළවල් කිසිදු බලපෑමකට යටත් නොකොට පුළුල් පරාසයකට ප්‍රතිලාභ ලැබෙන ලෙස ක්‍රියාත්මක කළ යුතුය. එහි දී අස්වැසුම වැඩසටහන සමාලෝචනය කිරීමේ වැදගත්කම ද සාකච්ඡාවට භාජනය කරන ලදී.

මෙම අවස්ථාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් ප්‍රධානී පීටර් බෲවර්, නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී කට්සියරිනා ස්වර්යඩිසෙන්කා සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නේවාසික නියෝජිත සවාට් ජෙහාන් යන මහත්ම මහත්මින් සහභාගි වු අතර, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා සමඟ එරාන් වික්‍රමරත්න, කබීර් හෂීම්, (ආචාර්ය) හර්ෂ ද සිල්වා, නිරෝෂන් පෙරේරා, (මහාචාර්ය) ජී.එල්.පීරිස්, නාලක ගොඩහේවා, චන්දිම වීරක්කොඩි, වේලු කුමාර්, හර්ෂන සුපුන් රාජකරුණා යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ සුජීව සේනසිංහ මහතා ද සහභාගි වූහ. ඊට අමතරව ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සහ ව්‍යවසායකයන් නියෝජනය කරමින් ටානියා අබේසුන්දර, මහේන්ද්‍ර පෙරේරා, සුසන්ත ලියනාරච්චි, සුරේෂ් රාඝවන් සහ යෝගේශ්වරන් යන මහත්ම මහත්මීන් එක්විය.